# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2017 නොවැම්බර් මස 02 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2017. 11. 06 දින නිකුත් කරන ලදී)**

### ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන)

**2000 අංක 44 දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අධිකරණ අමාත්‍යතුමියගේ නියමය පරිදි පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 12.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 44 දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනතේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, රේඛීය නියෝජිතායතන අතර වඩා යහපත් සම්බන්ධීකරණයක් ඇති කිරීමේ අරමුණින් යුතුව වාණිජ සමථ මධ්‍යස්ථානයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්ගේ සංඛ්‍යාව ඉහළ දැමීම ය.

***3 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබීම සඳහා හැකියාව ලබා දීම සහ සභාපතිවරයාව ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ආකාරය පිළිබඳව නිශ්චිතව සඳහන් කිරීම ය.

## ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය
## (සංශෝධන)

එල්. ඩී. — ඕ. 29/2017.

**2000 අංක 44 දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2017 අංක     දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2000 අංක 44 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 44 දරන ශ්‍රී ලංකා වාණිජ සමථ මධ්‍යස්ථානය පනතේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (1) වන උපවගන්තියේ–

(අ) ''(1) මධ්‍යස්ථානයේ කටයුතු පරිපාලනය'' සිට ''පවරනු ලැබිය යුතු ය:–'' යන වචන දක්වා සියලු වචන සහ ඉලක්කම් ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

''(1) මධ්‍යස්ථානයේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය කිරීම පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත වන්නා වූ (මෙහි මින් මතු ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය:–

(i) නිලබලයෙන් පත්වන පහත සාමාජිකයන්, එනම්–

(අ) අධිකරණ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරට ඉහළ තනතුරක් දරන ඔහුගේ නාමිකයකු;

2—PL 010390 -475 (2017/10)

(ආ) මහා භාණ්ඩාගාරයේ ලේකම් හෝ මහා භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ තනතුරට වඩා ඉහළ තනතුරක් දරන ඔහුගේ නාමිකයකු;

(ii) අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත සාමාජිකයන්:–";

(ආ) එහි (ඉ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"(ඉ) අධිකරණ විෂයය පවරා ඇති අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙක්;";

(2) එහි (7) වන උපවගන්තියේ "(1) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) හෝ (ඈ) යන ඡේදවල" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1) වන උපවගන්තියේ (ii) වන ඡේදයේ (අ), (ආ), (ඇ) හෝ (ඈ) යන අනුඡේදවල" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:– ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

"(1) අමාත්‍යවරයා විසින්, මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් එක් අයෙකු එහි සභාපතිවරයා ලෙස පත් කළ යුතු ය.";

(2) එහි (2) වන උපවගන්තියේ "මණ්ඩලය අමතා" යන වචන වෙනුවට "අමාත්‍යවරයා අමතා" යන වචන ආදේශ කිරීමෙන්;

(3) (3) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:–

“(3) අමාත්‍යවරයා විසින්, මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් එක් අර්ධයකට නොඅඩු සාමාජික සංඛ්‍යාවක් විසින් සහාය දෙනු ලබන යෝජනා සම්මතයකින් අනතුරුව, සභාපතිවරයාව එම ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.”.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.